**යාපනය කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය - 2015**

---

යාපනය කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2011 පෙබරවාරි 08 දින එළඹි අංක 2710 - එස්ආර්අයි (සාමාන්‍ය මෙහෙයුම්) දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.05 වගන්තිය සහ අංක 2711 - එස්ආර්අයි (එස්එෆ්) (විශේෂ මෙහෙයුම්) දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය, වර්තමානයේ නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය යටතේ උතුරු පළාත් සභාව මඟින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සහ පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව ව්‍යාපෘතිය ක්රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘති ප්‍රදේශය තුළ ජීවත් වන පදිංචිකරුවන් සඳහා ජල සම්පාදන හා සනීපාරක්ෂක යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ යාපනය අර්ධද්වීපයේ ජල සම්පත් ආරක්ෂා කිරීම සහ කළමනාකරණය කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ව්‍යාපෘතිය සමන්විත වන්නේ (අ) ජල සම්පාදන හා සනීපාරක්ෂක යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම (ආ) යාපනය ජල සම්පත් කළමනාකරණය ශක්තිමත් කිරීම සහ (ඇ) ක්‍රියාත්මක කිරීමේ ධාරිතාවය වැඩිදියුණු කිරීම සඳහා යාපනය ප්‍රාදේශීය කාර්යාලය ඉදිකිරීමයි. ණය ගිවිසුම් අනුව, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන සංරචක යටතේ ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 16,460.07 කට සමාන එජඩො මිලියන 147.32 ක් විය. ඉන් රු.මිලියන 8,541.76 කට සමාන එජඩො මිලියන 76.45 ක් හෙවත් සියයට 52 ක් සැපයීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණු අතර රු.මිලියන 5,363.04 කට සමාන එජඩො මිලියන 48 ක් හෙවත් සියයට 33 ක් සැපයීමට "එජන්ස් ෆ්‍රැන්යිස් ඩි ඩිවලප්මන්ට්" (Agence Francaise de Development) එකඟ වී තිබුණි. ඉතිරි රු.මිලියන 2,555.27 කට සමාන එජඩො මිලියන 22.87 ක් හෙවත් සියයට 15 ක් සැපයීමට ශ්‍රී ලංකා රජය එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2011 පෙබරවාරි 15 දින ආරම්භ කරන ලද අතර 2017 පෙබරවාරි 14 වන විට නිම කිරීමට නියමිතය.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ

විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද යාවත්කාලීන කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකිද යන බව.

(ඉ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ල ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඊ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(උ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඌ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(එ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඒ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(ඔ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

---

**2.1 මතය**

---

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ල ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථකිරීම සඳහා ඉදිරිපත් කර ඇති වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

---

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

---

2015 දෙසැම්බර් 31 දින දක්වා එජන්ස් ෆ්‍රැන්සිස් ඩි ඩිවලප්මන්ට් (Agence Franciase de Development) විසින් අයකරන ලද බැඳීම් ගාස්තු රු.මිලියන 57.8 ක් ගිණුම්ගත කර නොතිබුණි. තවද ණය අංක 2710 එස්ආර්අයි සහ 2711 එස්ආර්අයි (එස්එෆ්) යටතේ ආසියානු සංවර්ධන බැංකුව විසින් අයකරන ලද එජඩො 116,938.65 ක් වූ පොලී මුදල්ද මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර නොතිබුණි.

**2.2.2 නොසැසඳු ශේෂ**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය විසින් සිදුකරන ලද කාර්යයන් පිළිබඳ කෙරීගෙන යන වැඩ රු.මිලියන 1,084.1 ක් විය. කෙසේ වුවද ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන අනුව, එය රු.මිලියන 1,347.8 ක් ලෙස දක්වා තිබුණි. රු.මිලියන 263.7 ක් වූ වෙනස සසඳා නොතිබුණි.

(ආ) නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, මෙම ව්‍යාපෘතිය යටතේ 2015 දෙසැම්බර් 31 දිනට මුළු ව්‍යාපෘති වියදම රු.මිලියන 491 ක් විය. කෙසේ වුවද ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ව්‍යාපෘති පිරිවැය රු.මිලියන 424 ක් විය. ඒ අනුව රු.මිලියන 67 ක වෙනස සසඳා මූල්‍ය ප්‍රකාශනවල ගලපා නොතිබුණි.

(ඇ) ලැබුණු තොරතුරු අනුව, ව්‍යාපෘතියේ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් මුදා හරින ලද රු.මිලියන 136.3 ක මුදල, ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.මිලියන 88.9 ක අනුරූපී මුදල සමඟ එකඟ වී නොතිබුණි. ණය නියෝජිතායතනයෙන් ලැබුණු ප්‍රේෂණයෙන් මෙන්ම ශ්‍රී ලංකා රජයෙන් ලැබුණු දායකයෙන් ව්‍යාපෘතියේ සේවකයන් සඳහා ගෙවන ලද රු.මිලියන 48.6 ක්වූ පාරිශ්‍රමික, මණ්ඩලය විසින් අඩුකර ගෙන තිබූ අතර ඉහත සඳහන් වෙනසට එය ප්‍රධාන වශයෙන් හේතු වී ඇති බව නිරීක්ෂණය විය.

**3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදන හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2015 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම්වල මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2015 වර්ෂය තුළ | | 2015 දෙසැම්බර් 31 දින දක්වා | |
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ආසබැ | 76.45 | 8,541.76 | 1,437.00 | 2.96 | 402.70 | 9.25 | 1,172.60 |
| ඒඑෆ්ඩී | 48.00 | 5,363.04 | 30.00 | 0.16 | 21.30 | 0.98 | 124.64 |
| ශ්‍රී ලං ර | 22.87 | 2,555.27 | 500.00 | 0.59 | 80.84 | 2.36 | 299.38 |
| | 147.32 | 16,460.07 | 1,967.00 | 3.71 | 504.84 | 12.59 | 1,596.62 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජල සම්පත් බෙදාගැනීම මත ඉරණමඩු ප්‍රදේශයේ ගොවීන්ගෙන් වූ දැඩි විරෝධය හේතුවෙන් ව්‍යාපෘතියේ කටයුතු අත්හිටුවා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘති කාර්යයන් ආරම්භ කළ දින සිට වර්ෂ 04 මාස 10 ක් ඉකුත් වීමෙන් පසුව 2015 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 16,460.07 කට සමාන එජඩො මිලියන 147.32 ක්වූ මුළු වෙන්කිරීමෙන් රු.මිලියන 1,596.62 කට සමාන එජඩො මිලියන 12.59 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

(ආ) ඉරණමඩු ජලාශයේ නව ජල තුළු මුව ගෙනයාම් මධ්‍යස්ථානය (new water intake lift station), පිරිසිදු කිරීම් පිරියත, පොම්ප කිරීමේ මධ්‍යස්ථානය ඉදිකිරීම හා යාපනය මහ නගර සහා ප්‍රදේශය සඳහා පිරිසිදු නොකළ හා පිරිසිදු කළ ජලය සම්ප්‍රේෂණ ප්‍රධාන නළය එළීම සඳහා රු.මිලියන 5,363.04 කට සමාන එජඩො මිලියන 48 ක් සැපයීමට ශ්‍රී ලංකා රජය ඒජන්ස් ෆ්‍රැන්කයිස් ඩී ඩිවලප්මන්ට් සමඟ වෙනම ණය ගිවිසුමකට එළඹ තිබුණි. ඉන් රු.මිලියන 124.64 ක මුදලක් හෙවත් සියයට 2.3 ක් වර්ෂය අවසානය වන විට ව්‍යාපෘතිය විසින් උපයෝජනය කර තිබුණි. කෙසේ වුවද ව්‍යාපෘතියේ කාර්යයන් අත්හැරීම හේතුවෙන් 2015 ඔක්තෝබර් 06 දින ණය මුදල අවලංගු කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස 2012 වර්ෂයේ සිට 2015 දක්වා අරමුදල් ඌන උපයෝජනය මත ගෙවන ලද රු.මිලියන 57.80 ක් වූ බැඳීම් ගාස්තුවලට අමතරව රු.මිලියන 11.90 ක වන්දි මුදලක් හා රු.මිලියන 15.2 ක් වූ ශක්‍යතා ගාස්තු ව්‍යාපෘතිය විසින් ගෙවා තිබුණි.

**3.2 භෞතික ප්‍රගතිය**

-------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉහත 3.1 (අ) ඡේදයේ සඳහන් පරිදි, යාපනය අර්ධද්වීපය සඳහා ප්‍රධාන ජල ප්‍රභවයක් ලෙස ඉරණමඩු ජලාශය යොදා ගැනීමට එරෙහිව ඉරණමඩු ප්‍රදේශයේ ජීවත්වන ජනතාවගෙන් වූ දැඩි විරෝධතා හේතුවෙන් ව්‍යාපෘති කටයුතු අත්හැර දමා තිබුණි. කෙසේ වුවද යාපනය අර්ධද්වීපයේ ජල අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා මුහුදු ජලයේ ලුණු ඉවත්කිරීමේ කාර්යය සඳහා ව්‍යාපෘතියේ කාර්යයන් වෙනස් කිරීමට 2015 ජුලි 15 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර තිබුණි. කෙසේ වුවද වැඩ පිළිබඳ විෂය පථය වෙනස් කිරීමට සැලසුම් සහ ඒ සඳහා පිරිවැය ඇස්තමේන්තු 2015 දෙසැම්බර් 31 වන විටත් පිළියෙල කර නොතිබුණි.

(ආ) ලැබුණු තොරතුරු අනුව, අවිධිමත් මලාපවහන අපහරණය සහ පහසුවෙන් දූෂණය වීම සඳහා විවෘත වූ පොළව යට ඇති වැලි හා හුණුගල් තට්ටුව හේතුවෙන් යාපනය අර්ධද්වීපයේ බිම් ජල මූලාශ්‍රයන් දැඩි ලෙස දූෂණය වී තිබුණි. සාම්ප්‍රදායික මලාපවහන එකතු කිරීමක් හා අපහරණ පද්ධතියක් නොතිබීම නිසා ජලය සුරක්ෂිත කිරීමේ අවශ්‍යතාවය අවබෝධ කරගැනීම හේතුවෙන්, මලාපවහන එකතුකිරීමේ පද්ධතියක් සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම, මලාපවහන පිරිසිදු කිරීමේ පිරියත, අපද්‍රව්‍ය ගලායන මුහුදු පිටාර මෝයක් සහ නඩත්තු උපකරණ සැපයීම ඇතුළත් අර්ධද්වීපයේ මලාපවහන හා සනීපාරක්ෂක පද්ධති වැඩි දියුණු කිරීමේ කාර්යය සඳහා ව්‍යාපෘතිය විසින් රු.මිලියන 3,982 කට සමාන එජඩො මිලියන 35.64 ක් වෙන්කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තාව අනුව, මලාපවහන පිරිසිදු කිරීම් පිරියත හා මලාපවහන ජාලාකාර බෙදීයාම සඳහා දායකය සඳහා සැලසුම් වැඩ හා ලංසු ක්‍රියාවලිය 2015 දෙසැම්බර් 31 දිනට නිම කර තිබුණි. කෙසේ වුවද එම ඉදිකිරීම් වැඩ පසුව 2016 වර්ෂයේදී අත්හිටුවා තිබුණි. එබැවින් ගෘහ මූලිකයන් මාර්ගයෙන් හා 2015 වර්ෂයේදී රු.මිලියන 24.30 ක පිරිවැයකට මේ සම්බන්ධයෙන් සිදුකරන ලද භූ ලක්ෂණ සමීක්ෂණ මාර්ගයෙන් එකතු කර ගන්නා ලද තොරතුරු අරමුණු කළ කාර්යයන් සඳහා යොදා ගැනීමට නොහැකි වී ඇත.

(ii) ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුළත් කරන ලද සමාලෝචිත වර්ෂය තුළ නිම කිරීමට අපේක්ෂා කර තිබූ අනෙකුත් කාර්යයන් 30 කින් ප්‍රධාන මාර්ගය හරහා නළ එළීමට අදාළ කාර්යයන් හා කාර්යාල ගොඩනැගිලි ඉදිකිරීම්වලට අදාළ වැඩ පමණක් රු.මිලියන 266.6 ක පිරිවැයකට 2015 දෙසැම්බර් 31 දිනට නිමකර තිබුණි.